දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය - 2020

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 82 ඡේදය ප්‍රකාරව, 2020 දෙසැම්බර් 31 දිනට පැවති පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් රු.493,165 ක් ජංගම නොවන වගකීම් යටතේ දක්වනු වෙනුවට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. එම ප්‍රමිතයේ 118 හා 119 ඡේද ප්‍රකාරව, ශුද්ධ වත්කම් /ස්කන්ධය තුළ ඇතුළත් සංරචකවල සමාලෝචිත වර්ෂය තුළදී සිදුවූ වෙනස්වීම් පැහැදිළිව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළදී විවිධ වැඩසටහන් සඳහා වැය කර තිබුණු රු.4,345,936 ක විස්තර අදාළ වැඩසටහන් අනුව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | 2021 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනවල වියදම් වර්ගීකරණය කරමින් හා නිසි පරිදි හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය පිළියෙල කරමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 ප්‍රකාරව අවශ්‍ය වන හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය වෙනුවෙන් ගෙවිය යුතු රු.3,536,000 ක් උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම | 2021 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනවල මෙම වරද නිවැරදි කරන බව. | මෙම වරද නිවැරදි කරමින් 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | | |
| (ආ) | අස්පෘෂ්‍ය වත්කම් යටතේ දැක්විය යුතු මුළු පිරිවැය රු.2,998,625 ක් වූ ශ්‍රව්‍ය හා දෘෂ්‍ය විඩියෝපට වටිනාකම,දේපල, පිරියත හා උපකරණය යටතේ වර්ගීකරණය කිරීමේ වරද නිවැරදි කර තිබුණු නමුත් එම වත්කම්වල ක්ෂය වෙන්කිරීම් ප්‍රමාණයන් අතර වෙනස වූ රු.1,155,241 ක අධි ක්ෂය වෙන්කිරීම් නැවත සමුච්චිත අතිරික්තතා/ඌනතා ගිණුමට ගලපා නොතිබුණි. මෙම නිසා ඊට සමාන අගයකින් අස්පෘෂ්‍ය වත්කම්වල ශුද්ධ අගය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | -එම- | -එම- |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | | රු. | | |
| (අ) | 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 14 (ජ) වගන්තිය | දුම්කොළ හා මද්‍යසාර සම්බන්ධ සියළු විමර්ශන සහ අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය සමීක්ෂණය කර නොතිබුණු අතර පනත යටතේ බලයලත් නිලධාරීන් 04 දෙනාගෙන් 02 දෙනෙකු විසින් පමණක් පවරන ලද නඩු ප්‍රමාණයන් පිළිබඳව වාර්ෂික වාර්තාවක් ලබා ගැනීම පමණක් සිදුකර තිබුණි. | ශ්‍රී ලංකා පොලීසිය විසින් අදාළ තොරතුරු 2021 ජූලි 10 දින අධිකාරිය වෙත විද්‍යුත් තැපැල හරහා ලබා දුන් බව. | අධිකාරිය පනතේ සඳහන් කාර්යයන් ඉටුකිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 381, මුදල් රෙගුලාසි 625(3) හා 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන මුදල් | භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2008 සහ 2015 යන වර්ෂවලදී ලංකා බැංකුවේ අධිකාරිය නමින් වූ බැංකු ගිණුම් දෙකක් විවෘත කර තිබුණි. එසේම ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය සඳහා ලබාදී තිබුණු රු.1,203,537 ක් වූ ප්‍රදාන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම | අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත 2021 වර්ෂයේ සිට විවිධ පාර්ශව විසින් ප්‍රදාන ලෙස ලබා දෙන මුදල් භාණ්ඩාගාරයේ තැන්පත් කරමින් මුදල් රෙගුලාසි සහ අනුමත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බව. | අදාළ මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර තිබුණු ලිපිය | මත ලබා ගෙන නොතිබුණු අතර මුදල සෘජුවම එම ලංකා බැංකු ගිණුමකට බැර කර තිබුණි. තවද ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී එම මුළු ප්‍රදානයම වියදම් කර තිබුණි. | | |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>(i) 5.2.1 සහ 5.2.3 වගන්තිය | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, එදිනට අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ශේෂ පත්‍රය සහිතව සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද, චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන ලෙස අයවැය ලේඛනය පමණක් පිළියෙල කර තිබුණි. එසේම භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රතිපාදනවලට අදාළ ක්‍රියාකාරකම් පමණක් එහි ඇතුළත් කර තිබුණු අතර ඉහත සඳහන් බැංකු ගිණුමට සෘජුවම ලැබී තිබුණු විදේශ ප්‍රදානවලට අදාළ ක්‍රියාකාරකම් එහි ඇතුළත්කර නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව වර්ෂය සඳහා අවශ්‍යවන අයවැය ගත ලේඛන සකස් කිරීමටත්, අධිකාරිය විසින් පිළියෙල කරනු ලබන අයවැය ලේඛනය වෙත සෘජු විදේශ ප්‍රදානවලට අදාල ක්‍රියාකාරකම් අන්තර්ගත කර ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය කටයුතු යොදන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අධිකාරියේ සියලුම කටයුතු ආවරණය කෙරෙන පරිදි අයවැය ලේඛනය පිළියෙල කළ යුතුය. |
| | (ii) 6.3.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු කෙටුම්පත් වාර්ෂික වාර්තාව චක්‍රලේඛයේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල වන ලෙස පිළියෙල කර නොතිබුණු අතර පනතේ සඳහන් අධිකාරියේ කර්තව්‍යයන්, විදේශ ප්‍රදාන යටතේ සිදුකරන ලද කර්තව්‍යයන් යනාදිය ඊට ඇතුළත් කර නොතිබුණි. | 2020 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු කෙටුම්පත් වාර්ෂික වාර්තාව පරිපූර්ණ වාර්තාවක් නොවන බව හා නිසි ලෙස පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| | (iii) 7.4.1 වගන්තිය | වර්ෂයක් තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පැවත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා | යම් යම් හේතූන් මත 2020 වර්ෂය වෙනුවෙන් විගණන සහ කළමනාකරණ කමිටු | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට |

| | | |
|---|---|---|
| කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි | රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව. | කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,337,220 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.472,997 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.864,223 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට දේශීයව සහ විදේශීයව ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.21,709,620 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ දේශීයව සහ විදේශීයව ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.21,709,620 කින් එනම් සියයට 90 කින් අඩුවී තිබුණු අතර අධිකාරියේ වැඩ සටහන් සඳහා වූ වියදම රු.22,061,982 කින් එනම් සියයට 83 කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දුම්කොළ හා මද්‍යසාර පාදක කොටගත් උපද්‍රවයන්ගෙන් සමාජය නිදහස් කර ගැනීම සඳහා සියලු සමාජීය අංශ ඒකරාශී කිරීම යන අධිකාරියේ මෙහෙවර ඉටුකිරීමට හැකි වන අයුරින් වාර්ෂිකව ප්‍රමාණවත් වූ දේශීය හෝ විදේශීය අරමුදල් සම්පාදනය කර ගැනීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි. ඒ හේතුවෙන් 2017 වර්ෂයේදී වැඩසටහන් වෙනුවෙන් දරන ලද රු.මිලියන 23.11 ක් වූ වියදම 2020 වර්ෂය වන විට රු.මිලියන 4.35 ක් දක්වා සියයට 81 කින් අඩුවී තිබුණි. එසේම 2017 වර්ෂයේදී පනතේ සඳහන් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් දරන ලද වියදම, අධිකාරිය දෛනිකව පවත්වාගෙන යාම වෙනුවෙන් දරන ලද වියදමට සාපේක්ෂව සියයට 132 ක් වූ නමුත් 2020 වර්ෂය වන විට එය සියයට 20 දක්වා පහත වැටී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට අධිකාරියේ කාර්යය සාධනය සියයට 112 කින් පරිහී තිබුණු බව නිරීක්ෂණය විය. | රට තුළ ඇතිවූ කොවිඩ් වසංගතය 2020 වර්ෂය තුළදී වැඩසටහන් වෙනුවෙන් දරන ලද වියදම පහත වැටීමට ප්‍රධානතම හේතුව වූ අතර ක්‍රියාකාරී සැලැස්මෙහි ඉටු කළ හැකි කාර්යයන් පමණක් ඉටුකළ බව, 2021 වර්ෂය තුළදී රජය විසින් කොවිඩ් පාලනයට ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින්, පවත්නා සීමාවන් යටතේ රැස්වීම්, වැඩසටහන් හා වැඩමුළු ආදිය පැවැත්වීමට කටයුතු කළ බව, ඒ අනුව අධිකාරියෙහි කටයුතුවල වර්ධනයක් පවත්වා ගනිමින් කාර්ය සාධනය ඉහල දැමීමට කටයුතු කිරීමට හැකි උපරිමයෙන් වග බලා ගන්නා බව. | අධිකාරියේ කාර්යය සාධනය ඉහළ නැංවීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රදාන මත 2019 වර්ෂයේදී ආරම්භකර තිබුණු ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ පළමු අදියර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණු අතර මෙම ව්‍යාපෘතියට අදාළ සේවාවන් ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව සැපයුම්කරුවන් 03 දෙනෙකු වෙත රු.2,904,185 ක් ගෙවා තිබුණි. | 2019 වසර අග භාගයේදී සිදුකළ ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ පළමු අදියර වෙනුවෙන් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව ගෙවීම් සිදු කළ බව හා එහිදී අධිකාරිය නමින් මිල ගණන් කැඳවීම ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කර ඇති බව. | රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ අපේක්ෂිත භෞතික ප්‍රගතිය සඳහා වූ ඉලක්ක හඳුනාගෙන නොතිබුණු අතර මෙම හේතුවෙන් එකිනෙක ක්‍රියාකාරකම්වල භෞතික කාර්යය සාධනය මැනීම සඳහා නිශ්චිත මිනුම් නිර්නායකයන් නොතිබුණි. එසේම ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය හා පිළියෙල කර තිබුණු ප්‍රගති වාර්තාවල ඇතුළත් කර තිබුණු අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය එකිනෙකට වෙනස් වූ බැවින් සහ බැංකු ගිණුමට ඍජුවම ලැබී තිබුණු විදේශ ප්‍රදානවලට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාවල ඇතුළත් කර නොතිබුණු බැවින් අධිකාරියේ මූල්‍ය කාර්යසාධනය නිවැරදිව හඳුනාගැනීමට නොහැකි විය | අධිකාරිය වෙනුවෙන් පිළියෙල කරන ක්‍රියාකාරී සැලැස්ම තුළට අපේක්ෂිත භෞතික ප්‍රගතිය සඳහා වූ ඉලක්ක ඇතුළත් කරමින් පිළියෙල කිරීමට කටයුතු කරන බව හා මේ පිළිබඳව අධිකාරියෙහි අවධානය යොමු කර ඉදිරියේදී මෙම තත්ත්වයන් වලක්වා ගනිමින් කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව භෞතික කාර්යය සාධනය මැනීම සඳහා නිශ්චිත මිනුම් නිර්නායකයන් අන්තර්ගත වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදි අධිකාරිය විසින් සිදුකළ ගනුදෙනු පිළිබඳ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය වෙතින් ලිඛිත ඉල්ලීමක් සිදු කළ නමුත් 2020 වර්ෂය සඳහා විගණනයක් සිදු නොකෙරුණු බව. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය. |